## විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය - 2015

---

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මං විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව, ගනුදෙනුවක් සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නිශ්චිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති විට කළමනාකරණය විසින් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර ව්‍යවහාර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වටිනාකම රු.1,861,115 ක් වූ ප්‍රාග්ධන වත්කම් ක්‍රමක්ෂය කිරීම සම්බන්ධයෙන් එවැනි ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.74,243,264 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද තාවකාලිකව අක්‍රියවී ඇති, ක්‍රියාකාරි භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති හා බැහැර කිරීමට ඇති දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීමට හා සාධාරණ අගය හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.20,464,465 ක් වූ තොගය අගය කිරීම සම්බන්ධයෙන් යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හා භාවිතා කළ පිරිවැය සූත්‍රය හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ස්වරූපයේ වියදමක් වූ රෝහල් කාර්ය මණ්ඩලයේ වැටුප් පිළියෙල කිරීම සඳහා රු.200,000 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු මෘදුකාංගයේ (Payroll System) වටිනාකම ප්‍රාග්ධනිත කරනු වෙනුවට ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.12,850,104 කින් වැඩියෙන් ගණනයකර ගිණුම්ගත කර තිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ සේවක පාරිතෝෂික වෙන්කිරීම රු.8,525,242 ක් ගැලපීම වෙනුවට ඉකුත් වර්ෂයේ වෙන්කිරීම වූ රු.4,378,955 ක් ගලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග අත්හැරීම් හා නිවැරදි ඒකක මිල යොදා නොගැනීම හේතුවෙන් ඉතිරි තොගයේ පිරිවැය රු.47,656 කින් අඩුවෙන් ගණනය කර ගිණුම් ගත කර තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

-------------------------------

පවත්වා ගෙන යනු ලබන ලේඛනවලට අනුව ශල්‍යකර්ම වර්ග 4 ක් හා පරීක්ෂණ වර්ග 2 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී අයකර තිබුණු ගාස්තු එකතුව රු.20,346,500 ක් වුවද, මුදල් පොතට අනුව එම අගය රු.19,389,750 ක් වූයෙන් රු.956,750 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 138, 245 හා 257 | සමාලෝචිත වර්ෂය තුළදී වවුචර් 5 කට අදාළව රු.3,276,632 ක් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 (1) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2016 ජුලි 01 දින වන විටත් සිදුකර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සියලු ස්ථාවර වත්කම්වල තොරතුරු ඇතුළත් කරමින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු නමුත් බඳවා ගැනීමේ පරිපාටි පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 ඡේදය | සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු.1,178,100 ක්වූ Defibrillator යන්ත්‍ර දෙකක් මිලදී ගෙන තිබුණි. |
| (ඉ) 2014 අප්‍රේල් 30 දිනැති අංක ඩීඑම්එස්/1756 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ට අනුගත වන පරිදි රෝහල් කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කළයුතු බවට අදාළ ලිපිය මගින් උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) 2015 මැයි 28 දිනැති අංක 01-21/2015 දරන සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පොදු චක්‍රලේඛයෙහි උපලේඛන අංක 17 | රජයට අවම පිරිවැයක් වන ආකාරයට අමු ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීම, ලබා ගැනීම, පිසීම හා බෙදාහැරීම පිළිබඳ කළමනාකරණය සඳහා ආහාර කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි. |

(ඳ) ඖෂධ කළමනාකරණ අත්පොත

(i) 3 පරිච්ඡේදයේ 4 (ඇ) ඡේදය — මාසික ඖෂධ සමාලෝචන කමිටු රැස්වීම් පවත්වා එහි ප්‍රගතිය පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කර නොතිබුණි.

(ii) 5 පරිච්ඡේදයේ 2 ඡේදය — ඖෂධ තොග පිළිබඳව අවම තොග මට්ටම්, උපරිම තොග මට්ටම්, යළි ඇණවුම් මට්ටම හා ආරක්ෂිත තොග මට්ටම පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,023,884 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,558,018 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,581,902 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන වැඩිවීම් රු.29,000,000 ක් වුවද වැටුප්, වේතන, සේවක ප්‍රතිලාභ හා සැපයුම් සේවා වියදම් වැඩිවීම රු.52,101,756 ක් වීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,944,390 ක ඌනතාවයක් වුවද 2012 වර්ෂය වනවිට එය රු.3,646,870 ක අතිරික්තයක් වී තිබුණි. 2013 වර්ෂයේදී එය නැවතත් රු.20,378,939 ක ඌනතාවයක් බවට පත්වී තිබුණු අතර 2014 වර්ෂය වනවිට රු.3,558,018 ක අතිරික්තයක් බවට පත්වී 2015 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.20,023,884 ක ඌනතාවයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැළකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.65,644,194 ක්වූ මණ්ඩලයේ දායකත්වය සියයට 8 සිට සියයට 59 අතර උච්චාවචනයක් සහිතව 2015 වර්ෂයේදී රු.119,370,321 ක් දක්වා වර්ධනයවී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනත ප්‍රකාරව මෙම මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සහ රෝගී තැනැත්තන් රැක බලා ගනු ලබන ආයතනයක් වශයෙන් එය කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම මණ්ඩලයේ කර්තව්‍ය විය. එම කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ බාහිරව හා නේවාසිකව ප්‍රතිකාර ලබාගත් මුළු රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් 294,786 ක් හා 323,362 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රෝගීන්ගේ වැඩිවීම සියයට 10 ක් විය. ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ රෝහලේ සමස්ථ වියදම පිළිවෙලින් රු.217,597,454 ක් හා රු.273,524,255 ක් වූ අතර සමස්ථ වියදමේ වැඩිවීම සියයට 26 ක් විය. ඉන් ඖෂධ වියදමේ වැඩිවීම සියයට 24 ක්වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකිරණ පරීක්ෂණ සංඛ්‍යාව 970 කින් හෙවත් සියයට 21 කින් වැඩි වුවද විකිරණ පරීක්ෂණ ද්‍රව්‍ය වියදම රු. 340,923 කින් හෙවත් සියයට 150 කින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි.

(ඇ) 2015 පෙබරවාරි මාසයේදී ඉදිකිරීම් නිම කර තිබුණු තුන් මහල් ගොඩනැගිල්ල තුළ 2015 දෙසැම්බර් 31 දින වන විට Laboratory, Chronic Ulcer Care Unit, Utility Rooms හා Wound Care Unit යන අංශ ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණද 2016 ජුනි 30 දින වනවිටත් එම අංශ ස්ථාපිත කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහලේ එක් එක් අංශවල අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් විධිමත් පරිදි වාර්ෂික ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය අවශ්‍යතා ඇස්තමේන්තු කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණු රු.8,453,826 ක් පිරිවැය වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 30 ක් බාහිර සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමට සිදුවී තිබුණි. ඊට අමතරව වෛද්‍ය සැපයුම් අංශයෙන් ඖෂධ මිලදී නොගෙන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙතින් වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.14,493,024 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) තොග ලේඛන නිසි පරිදි පවත්වා නොතිබුණු අතර නිවැරදිව තුලනය කර නොතිබුණි. මේ හේතුවෙන් තොග ලේඛනවල සෘණ ශේෂයන් ඇතිවී තිබූ අතර එම ශේෂයන් ඉවත්වන පරිදි මුළු පිරිවැය රු. 1,456,887 ක් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 32 ක් තොග ලේඛනවලට ඇතුළත් කර තිබුණි.

(ඇ) ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ඇණවුම් කිරීම, භාර ගැනීම, නිකුත් කිරීම, තොග ලේඛන පවත්වාගෙන යාම හා තොග ගබඩාව භාරව ක්‍රියා කිරීම සම්බන්ධ කාර්යයන්වල වැඩ බෙදීමක් සිදුවන ආකාරයට විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර එම සියළුම කාර්යයන් එක් නිලධාරියෙකු වෙත පවරා තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහලේ අවශ්‍යතාවයට වඩා වැඩි ධාරිතාවයකින් යුත් යන්ත්‍ර දෙකක් මිලදී ගෙන තිබුණු බැවින් එම යන්ත්‍ර දෙක ඌන උපයෝජිතව පැවතුණි. විස්තර පහතින් දැක්වේ.

(i) 2013 වර්ෂයේදී රු.2,500,000 ක් වැය කරමින් මිලදීගෙන තිබුණු Fully Automated Hematology Analyzer යන්ත්‍රයේ උපරිම ධාරිතාවය පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 60 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී පැයකට පරීක්ෂණ ඒකක 17 ක් පමණක් සිදුකර තිබුණි.

(ii) 2013 වර්ෂයේදී රු.8,736,000 ක් වැය කරමින් මිලදී ගෙන තිබුණු, Fully Automated Biochemistry Analyzer යන්ත්‍රය මගින් සිදුකළ හැකිව තිබුණු විවිධ පරීක්ෂණ වර්ග 21 ක් අතරින් සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ වර්ග 9 ක් පමණක් සිදුකර තිබුණි. තවද මෙම යන්ත්‍රයේ උපරිම ධාරිතාවය පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 300 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී පැයකට පරීක්ෂණ ඒකක 15 ක් පමණක් සිදුකර තිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් 2013 වර්ෂයේදී ලැබී තිබුණු රු.38,000 ක් වටිනා Nebulizer යන්ත්‍රයක් 2016 ජුනි 23 දින වන විටත් භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) 2000 වර්ෂයේදී රු.765,000 ක් වැයකර මිලදීගෙන තිබුණු අක්ෂි ශල්‍යකර්ම සඳහා භාවිතයට ගන්නා Operating Microscope උපකරණය වර්ෂ 6 කට වැඩි කාලයක සිට භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් වටිනාකම රු.12,431,157 ක්වූ රසායනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය පවරා තිබුණු කොන්ත්‍රාත්කරුගෙන් දින 112 ක ප්‍රමාද කාලය වෙනුවෙන් රු.672,000 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. බිත්ති හා උළුවහු පුපුරා තිබීම, දොර අගුළු කැඩී තිබීම, වහලයෙන් ජලය කාන්දුවීම හා සිවිලිම ඇදවීම ආදීවූ අඩුපාඩු සහිතව ඉදිකිරීම් සිදුකර තිබුණු අතර උපදේශකවරයා විසින් නිසි අධීක්ෂණයක් හා සුපරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් වටිනාකම රු.817,435 ක්වූ රසායනාගාර ගොඩනැගිල්ලේ පළමු මහල බෙදා වෙන් කිරීම (Partition) හා ජනේල සඳහා ග්‍රිල් (Grill) ආවරණ යෙදීමේ කාර්යය සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි. කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලසීමාව අවසන් වනතුරු කොන්ත්‍රාත් වටිනාකමින් අවම වශයෙන් සියයට 5 ක් රඳවා ගැනීමකින් තොරව හා උපදේශකවරයා විසින් නිර්දේශ කර සහතික කරන ලද මැනුම් පත්‍ර සමඟ අවසන් බිල්පත ඉදිරිපත් කර නොතිබියදී කොන්ත්‍රාත්කරු වෙත රු.817,435 ක් වූ සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

(ඇ) පස් කියුබ් 1,190 ක් පුරවා රෝහල් භූමිය ගොඩකිරීම සඳහා කියුබ් 1 කට රු.3,500 ක් වූ අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද කොන්ත්‍රාත්කරු විසින් පසුව කරන ලද ඉල්ලීමකට අනුව කියුබ් 1 කට රු.4,200 බැගින් ගෙවීම නිසා රු.828,576 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රෝහලේ අනුමත කාර්ය මණ්ඩලය 216 ක්වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 195 ක් විය. රෝහලේ ප්‍රධාන විධායක තනතුර වන රෝහල් අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩුව වර්ෂ 10 කට වැඩි කාලයක සිට පිරවීමට කටයුතු කර නොතිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා අනුමැතියකින් තොරව නිලධාරීන් 08 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට අනුමත වී තිබුණු නිර්වින්දන විශේෂඥ වෛද්‍ය තනතුරේ පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී බාහිර නිර්වින්දන වෛද්‍යවරයෙකුගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් රු.314,000 ක් වැයකර තිබුණි.

(ඇ) අනුමත වෛද්‍ය රසායනාගාර කාර්මික තනතුරු 3 ක් පුරප්පාඩු වීම හේතුවෙන් රසායනාගාරයේ පවතින අධි ධාරිතාවයෙන් යුත් රසායනාගාර උපකරණවලින් ප්‍රමාණවත් සේවාවක් ලබා ගැනීමට නොහැකිවී තිබුණි.

(ඈ) රෝහල සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටියක් නොතිබීම හේතුවෙන් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීමේ පරිපාටිය උපයෝගී කර ගෙන තිබුණද එම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන නොසළකා වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්දට ලකුණු

45 ක්ද, සම්මුඛ පරීක්ෂණය වෙනුවෙන් ලකුණු 20 ක්ද වශයෙන් ලබාදී, බඳවා ගත හැකි වයස් සීමාව වැඩි කර ඒ වනවිටත් රෝහල තුළ පුහුණුව ලබමින් සිටි 4 දෙනෙකු කළමනාකරණ සහකාරවරුන් වශයෙන් බඳවා ගෙන තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2015 වර්ෂයේ සිට 2019 වර්ෂය අතර කාලසීමාවට අදාළව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් එය 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ ක්‍රියාකාරකම් ඊට ඇතුළත්කර නොතිබුණු අතර වාර්ෂික කාර්යසාධන වාර්තාද පිළියෙල කර නොතිබුණි.

**5.3 විගණන කමිටු**

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් 1 ක් පමණක් පවත්වා තිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 27 සිට සියයට 420 දක්වා පරාසයක විචලනයන් පැවතුණි. තවද විෂයයන් 5 ක් සඳහා ඇස්තමේන්තු කර තිබූ රු.2,775,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රෝහල් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය | ඉදිකිරීම් කොන්ත්‍රාත් පිළිබඳව මනා අධීක්ෂණයක් සිදු නොකිරීම හා උපරිම කාර්යසාධනයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) තොග පාලනය | තොග පාලනය සම්බන්ධ විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා නොතිබීම |

| | | |
|---|---|---|
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කාර්ය මණ්ඩල බඳවාගැනීම සිදුකර නොතිබීම. |
| (ඇ) | අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම හා රෝගීන් වෙත ආහාර ලබාදීම. | අමු ආහාර සපයා ගැනීමේ සිට රෝගීන් වෙත ලබාදීම දක්වා කටයුතුවලදී සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කර නොතිබීම හා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා නොතිබීම. |